# සී/ස ලංකා ගල්අඟුරු (පුද්) සමාගම

# පුරප්පාඩු

**සී/ස ලංකා ගල්අඟුරු (පුද්) සමාගමේ පවත්නා පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## 1. කළමනාකාර සහකාර තනතුර (01)

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී එක්වරකදී අවම වශයෙන් සිංහල / දෙමළ භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි ඇතුළු විෂයයන් 05ක් වත් සම්මාන සාමාර්ථ සහිතව සමත් වීම සමග එක්වරකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ (නව විෂය නිර්දේශයේ විෂයයන් තුනකින් හෝ පැරණි විෂය නිර්දේශයේ විෂයයන් හතරකින්) විභාගය සමත් වීම,

හෝ

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී එක්වරකදී අවම වශයෙන් සිංහල / දෙමළ භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි ඇතුළු විෂයයන් 05ක් වත් සම්මාන සාමාර්ථ සහිතව සමත් වීම සමග / පිළිගත් ආයතනයක කළමනාකාර සහකාර තනතුරේ අවම වශයෙන් අවුරුදු 2 ක පළපුරුද්ද.

**වයස** : 2021 අප්‍රේල් මස 04 වැනිදාට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 40ට නොවැඩි අයවළුන් විය යුතුය.
(අභ්‍යන්තර උසස් කිරීම් සඳහා වයස බලපානු නොලැබේ)

**අමතර සුදුසුකම්** : ඉංග්‍රීසි භාෂාවෙන් ලිවීමේ සහ කතාකිරීමේ/ මනා සන්නිවේදන කුසලතාවයත්, තොරතුරු තාක්ෂණ (පරිඝණක) දැනුමත් අමතර සුදුසුකම් වේ.

**වැටුප් පරිමාණය** : **SM - 4 Rs. 47,660/= - 5 x Rs. 635/= - 10 x Rs. 650/= - Rs. 57,335/=**

## 2. කාර්යාල සහායක තනතුර (01)

අධ්‍යයන පොදුසහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී උපරිම වාර දෙකක් තුළ අවම වශයෙන් සම්මාන දෙකක් සහිතව සිංහල / දෙමළ හා ගණිතය ඇතුළු විෂයයන් හයක් සමත්ව තිබීම

හෝ

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගත් කාර්මික වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද කාර්යාල සහායක තනතුරේ ක්‍රියාකාරිත්වයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටමට වඩා අඩු නොවන ප්‍රවීණතා සහතිකයක් ලබා ගැනීම.

**වයස** : 2021 අප්‍රේල් මස 04 වැනිදාට වයස අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි අයවළුන් විය යුතුය.

**වැටුප් පරිමාණය : SN- 5 Rs. 43,715/= -15 x 540 = 51,815/=**

**පත්වීමේ ස්වභාවය**

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්ති භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිත තනතුරු වේ.

**වෙනත්**

1. සෑම ඉල්ලුම්කරුවෙක්ම ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
3. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

සියළු අයදුම්කරුවන් තමන්ට අදාල තනතුරුවලට අවශ්‍ය සුදුසුකම් ඇතුලත් අධ්‍යාපනික සහතිකපත්‍රවල, වෘත්තීය සුදුසුකම් තහවුරු කෙරෙන සහතිකපත්‍රවල සහ සේවා පළපුරුද්ද තහවුරු කෙරෙන සහතිකවල පිටපත් සහිතව තමන් විසින් සකස්කරන ලද අයදුම්පත් තමන් පිළිබඳ විමසීමට හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම, ලිපිනය, දුරකතන අංකය සහිතව **2021 අප්‍රේල් මස 04** වැනිදාට හෝ ඊට ප්‍රථමව **"වැඩබලන සාමාන්‍යාධිකාරී, සී/ස ලංකා ගල්අඟුරු (පුද්) සමාගම, අංක 51/3, සුරනිමල පෙදෙසෙ, දුටුගැමුණු වීදිය, කොහුවල, දෙහිවල."** වෙත ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් පමණක් යොමුකළ යුතුය.

අයදුම්පත් යොමුකිරීමේදී ලියුම්කවරයේ වම්පස ඉහළ කෙළවරේ "..................... තනතුර (තමන් අයදුම් කරන තනතුර) සඳහා අයදුම් කිරීම" ලෙස සටහන් කිරීම අත්‍යාවශ්‍ය වේ. එක් අයදුම්කරුවකුට අයදුම්කළ හැක්කේ එක් තනතුරක් සඳහා පමණක් වන අතර **2021 අප්‍රෙල් මස 04** වැනිදාට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

**සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ**

**සී/ස ලංකා ගල් අඟුරු (පුද්) සමාගම,**

**අංක 51/3, සුරනිමල පෙදෙස, දුටුගැමුණු වීදිය, කොහුවල,**
**දෙහිවල.**

**www.lankacoal.lk**